## ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය - 2014

---

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2011 වර්ෂයේදී බුත්තල, සේවක සංවර්ධන මධ්‍යස්ථානයෙන් භාර ගන්නා ලද ගොඩනැඟිලි හා ලී බඩු ආදී වත්කම් අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) මුළු වටිනාකම රු.19,411,037 ක් වූ ලී බඩු, උපකරණ, පොත් හා වාහන වැනි වත්කම් මඩකලපුව දිස්ත්‍රික්කයේ පැවති යුධ වාතාවරණය හේතුවෙන් 1990 වර්ෂයේදී නැතිවී තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(ඇ) උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාළත්වය හා ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීමේ (IRQUE) ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව, පරිගණක, ලී බඩු, පොත් හා උපකරණ වැනි එම ව්‍යාපෘතියේ වත්කම් විශ්වවිද්‍යාලයට භාරදී තිබුණි. කෙසේ වුවද එම වත්කම් අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

#### 2.2.2 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා විශ්වවිද්‍යාලයෙන් මාරුවී ගිය නිලධාරීන් 307 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.9,716,548 ක් වූ ණය ශේෂයන් වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. එම හිඟ ණය ශේෂ අයකර ගැනීමට හෝ අදාළ නිලධාරීන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට 2015 ජූනි 30 දක්වාත් විශ්වවිද්‍යාලය විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) විදේශ සැපයුම්කරුවන්ට ලබාදුන් එකතුව රු.5,000,378 ක් වූ අත්තිකාරම් එම ශේෂ අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම පිළිබඳ විමර්ශනය කිරීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 10 කට වැඩි කාලයක් ආනයන අත්තිකාරම් ගිණුම් 135 ක පැවතුණි.

(ඇ) විවිධ සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතුව රු.14,604,399 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 5 සිට 18 දක්වා කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| (i) X පරිච්ඡේදයේ 20.6 වගන්තිය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් විසින් ලබාගත් වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර පොදු ආකෘති 96 මඟින් මාසිකව විගණකාධිපතිවරයාට වාර්තා කර නොතිබුණි. |
| (ii) XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා ගැනීමට විශ්ව විද්‍යාලය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. වෙනත් සියළු විශ්ව විද්‍යාලවල පරිදි සම්ප්‍රදායක් වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පැමිණීමේ ලේඛනයක පැමිණීම සටහන් නොකරන බව මේ සම්බන්ධයෙන් නිසි බලධාරි විසින් මා වෙත දන්වා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 102 සිට 105 | (i) විශ්වවිද්‍යාලය සතු වාහනයක් අනතුරකට භාජනය වී තිබූ අතර එම වාහනය අළුත් වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,563,073 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද පාඩුවේ ප්‍රමාණය හා හේතුව නිශ්චය කර ගැනීම සඳහා හා වගකීම් පැවරීම සඳහා පියවර ගෙන නොතිබුණි. |
| | (ii) සමාලෝචිත වර්ෂය අවසානයට සිදුකරන ලද භෞතික පරීක්ෂණයට අනුව, උප කුලපති නිල නිවසේ ඉන්වෙන්ට්‍රි විෂයයන් 913 ක ඌනතාවයක් විය. මේ සම්බන්ධයෙන් පාඩුවේ ප්‍රමාණය නිශ්චය කර ගැනීමට හා වගකීම් පැවරීමට විමර්ශනයක් සිදුකිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රු.777,087,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.863,344,968 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.621,470,000 ක රජයේ

ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.765,406,686 ක ඌනතාවයක් වූයෙන් මුලා ප්‍රතිඵලයේ රු.97,938,282 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පුද්ගල පඩිනඩි රු.77,049,832 කින් වැඩිවීම මූලා ප්‍රතිඵලවල මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ.

#### (අ) විභාග ප්‍රතිඵල

2014 වර්ෂයේදී පවත්වන ලද අවසන් විභාග හා සමත්වූ උපාධිධාරීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| විස්තරය | කෘෂිකර්ම පීඨය | කලා හා සංස්කෘතික පීඨය | වාණිජ හා කළමනාකරණ පීඨය | විද්‍යා පීඨය | සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය |
|---|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී අවසාන විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 38 | 289 | 165 | 19 | 36 |
| විභාග සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 38 | 289 | 95 | 12 | 36 |
| (උපාධි විභාග සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව) අවසාන විභාග සඳහා පෙනීසිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 100% | 100% | 58% | 63% | 100% |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වාණිජ හා කළමනාකරණ පීඨයේ ව්‍යාපාර පරිපාලන උපාධිය, සඳහා ප්‍රතිඵල සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කර නොතිබූ අතර එය 2015 ජනවාරි මාසයේදී නිකුත් කර තිබුණි. ඒ අනුව වාණිජ උපාධිය හා ව්‍යාපාර පරිපාලන උපාධිය යන උපාධි ධාරාවන් දෙකම සඳහා සමත් වූ මුළු සිසුන් සංඛ්‍යාව 142 ක් වූ අතර පීඨ සමත් අනුපාතය සියයට 89 ක් විය.

(ii) විශ්ව විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ඉදිකිරීම් / පළමු මූලධර්මවල න්‍යායාත්මක සංකල්ප සැකසීම හා ඊළඟට නියම ලෝක තත්ත්ව ආදර්ශ අවබෝධ කර ගැනීම සඳහා සංවර්ධනය ඇතුළත් මූලික විද්‍යාව (ශුද්ධ විද්‍යාව) පිළිබඳ ගැඹුරු අධ්‍යයනය සිදුකළ යුතුවීම හේතුවෙන් විද්‍යා පීඨයේ පළමු ප්‍රයත්නයේදී සමත්වන අනුපාතය සැලකිය යුතු ලෙස අඩුවී තිබුණි.

(ආ) **ශිෂ්‍යයින් බඳවා ගැනීම**

පසුගිය වර්ෂ 03 තුළදී එක් එක් පීඨය සඳහා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව හා උපාධි ලබාගැනීමෙන් පසුව පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

| **පීඨය** | **බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව** | | | **උපාධිය ලබාගැනීමෙන් පසු පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව** | | |
|---|---|---|---|---|---|---|
| | **2014** | **2013** | **2012** | **2014** | **2013** | **2012** |
| කෘෂිකර්ම | 118 | 83 | 65 | 22 | 27 | 18 |
| කලා හා සංස්කෘතික | 210 | 276 | 543 | 311 | 374 | 305 |
| වාණිජ හා කළමනාකරණ | 208 | 201 | 180 | 81 | 96 | 54 |
| විද්‍යා | 192 | 214 | 151 | 34 | 57 | 27 |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා | 89 | 80 | 101 | 42 | 27 | - |
| එකතුව | 817 | 854 | 1,040 | 490 | 581 | 404 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ කෘෂිකර්ම පීඨයට බඳවාගත් සිසුන් සංඛ්‍යාව සියයට 42 කින් වැඩිවී තිබූ අතර කලා හා සංස්කෘතික පීඨය සහ විද්‍යා පීඨයට සමාලෝචිත වර්ෂය තුළ බඳවා ගත් සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 24 කින් හා සියයට 10 කින් අඩුවී තිබුණි.

(ඇ) **පුස්තකාල පරිපාලනය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කථිකාචාර්යවරුන් 15 දෙනෙකු විසින් පුස්තකාලයෙන් ලබාගත් පොත් 52 ක් නියමිත කාලපරිච්ඡේදය තුළ පුස්තකාලයට ආපසු භාරදීමෙන් තොරව වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාලයක් රඳවා ගෙන තිබුණි. කෙසේ වුවද මෙම පොත් ආපසු ලබාගැනීමට හෝ ප්‍රමාදයන් සඳහා රු.430,684 ක දඩ මුදලක් අයකර ගැනීමට විශ්ව විද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි.

(ii) ගං වතුර, දිලීර හා කෘමීන් නිසා හානිවූ රු.675,020 ක් පිරිවැය වූ පොත් ගිණුම් පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 4.2.1 ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ලී තට්ටු ඇඳන් හා අධ්‍යයන මේස ප්‍රසම්පාදනය

තට්ටු ඇඳන් 600 ක් සහ ලී අධ්‍යයන මේස 400 ක් සැපයීම සඳහා 2014 අගෝස්තු 15 දින අක්කරෙයිපත්තුහි පුද්ගලික සැපයුම්කරුවකුට රු.44,559,000 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත් ගිවිසුමේ පොදු කරුණු හා කොන්දේසිවල 26 වගන්තිය අනුව රු.4,455,000 ක් වටිනා කාර්ය සාධන ඇපකරයක් 2014 අගෝස්තු 25 ට පෙර ඉදිරිපත් කළ යුතු විය. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලීම් කළ පරිදි කාර්ය සාධන ඇපකරය ඉදිරිපත් කර නොතිබුණි.

(ii) විශ්ව විද්‍යාලයෙන් ගැණුම් ඇණවුමක් ලබාගැනීමෙන් තොරව සැපයුම්කරු විසින් 2014 ඔක්තෝබර් 10 සිට නොවැම්බර් 03 දක්වා කාල පරිච්ඡේදය තුළ රු.11,632,500 ක මුළු වටිනාකමට තට්ටු ඇඳන් 200 ක් හා අධ්‍යයන මේස 25 ක් සපයා තිබුණි. කෙසේ වුවද සියළු භාණ්ඩ ලැබීමෙන් පසු විශ්වවිද්‍යාලය විසින් අදාළ සැපයුම්කරුට ගැණුම් ඇණවුම් නිකුත් කර තිබුණි.

### 4.2.2 ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා කල් බදු පදනම මත ගොඩනැඟිලි ප්‍රසම්පාදනය

---

(අ) ශිෂ්‍යාවන් 250 දෙනෙකුට නවාතැන් පහසුකම් සැපයීමේ අරමුණින් මඩකලපුව, තන්නමුනෙයි හි ශාන්ත ජෝශප් කාන්තා නිවාසයේ ගොඩනැඟිල්ලක් කල් බදු පදනම මත විශ්වවිද්‍යාලය විසින් ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) තක්සේරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් තක්සේරුකරු විසින් ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාවට අනුව, මෙම ගොඩනැඟිල්ල සඳහා මාසික කුලිය රු.170,000 ක් විය. කෙසේ වුවද දිස්ත්‍රික් තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද වටිනාකම සැලකීමෙන් තොරව රු.400,000 ක මුදලක් මාසික කුලිය ලෙස විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැඟිල්ල අයිතිකරුට සමාලෝචිත වර්ෂය තුළ රු.1,150,000 ක මුදලක් කුලී ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

(ii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා යොදා ගැනීමට සුදුසු හා පිරිවැය ඵලදායී ගොඩනැඟිල්ලක් ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් රජයේ ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ආ) ශිෂ්‍යාවන් 65 දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් සැපයීමට මඩකලපුව, පුලියඩිකුඩා හි පිහිටි වෙනත් ගොඩනැඟිල්ලක රු.130,000 ක මාසික කුලියකට 2014 මැයි 01 දින සිට ලබාගෙන තිබුණි. කෙසේ වුවද තක්සේරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් තක්සේරුකරුගේ තක්සේරු වාර්තාවට අනුව, මෙම ගොඩනැඟිල්ල සඳහා මාසික කුලිය රු.82,500 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැඟිල්ලේ අයිතිකරුට රු.570,000 ක මුදලක් කුලී ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

### 4.2.3 උප කුලපති නිල නිවස සඳහා විදුලි උත්පාදන යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කිරීම

---

උපකුලපතිගේ නිල නිවසේ භාවිතය සඳහා රු.1,675,610 කට පුද්ගලික සමාගමකින් විදුලි උත්පාදන යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය විසින් මිලදී ගෙන තිබුණි. වගකීම් කාලය තුළ නොමිලයේ සේවා සැපයීම සඳහා සැපයුම්කරු එකඟවී තිබුණි. කෙසේ වුවද විශ්ව විද්‍යාලය විසින් මෙම සේවය ලබාගෙන නොතිබූ අතර, විදුලි උත්පාදන යන්ත්‍රයේ අවිධිමත් නඩත්තුව හේතුවෙන් වගකීම් කාල පරිච්ඡේදය තුළ මාස 2 කට වැඩි කාලයක් එම යන්ත්‍රය ක්‍රියාවිරහිතව තිබුණි.

### 4.2.4 විශ්ව විද්‍යාල පරිශ්‍රයේ බිම් දසුන් සැකසීම හා ගස් සිටුවීම

---

එවකට ජනාධිපතිවරයාගේ පැමිණීම හා විද්‍යා පීඨයේ ගොඩනැඟිලි සංකීර්ණය විවෘත කිරීම සනිටුහන් කිරීම සඳහා විද්‍යා පීඨ ගොඩනැඟිලි සංකීර්ණයේ ප්‍රධාන ප්‍රවේශය ඉදිරිපස බිම් දසුන් සැකසීම හා ගස් සිටුවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,752,740 ක මුදලක් විශ්ව විද්‍යාලය විසින් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම කාර්යය සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විවෘත තරඟකාරී ලංසු පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව, 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතියේ (HETC) උපදේශක විසින් නිර්දේශ කරන ලද කොන්ත්‍රාත්කරු විශ්වවිද්‍යාලය විසින් තෝරා ගෙන තිබුණි.

(ආ) 2014 අප්‍රේල් 18 දින අදාළ කාර්යයන් කොන්ත්‍රාත්කරු විසින් ආරම්භ කර තිබුණද, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) විසින් එම කොන්ත්‍රාත්කරු 2014 ජූලි 01 දින වැඩ නිම කිරීමෙන් පසුව තෝරා ගෙන තිබුණි.

(ඇ) සමාන වර්ගයේ පැල සඳහා වෙළඳපොළ පවත්නා හෝ වෙනත් සමාන සැපයුම්කරුවන්ගෙන් ලබාගත් රේටයන් සැලකීමෙන් තොරව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද රේටයන් පදනම් කරගෙන කොන්ත්‍රාත්කරුට රු.1,752,740 ක ගෙවීමක් කර තිබුණි.

### 4.2.5 උපකුලපති නිල නිවස සඳහා ගෘහ භාණ්ඩ විෂයයන් මිලදී ගැනීම

-----------------------------------------------------------------

කෑම මේස , නිදන කාමර කට්ටල, යෝග්‍යතා උපකරණ, සෝපා කට්ටල, ඇඳන් හා පුටු ආදී ගෘහ භාණ්ඩ විෂයයන් රු.1,447,873 ක වටිනාකමට 2013 මාර්තු 12 දින කොන්ත්‍රාත්කරුවකුගෙන් මිලදී ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීම වෙනුවට ඉහත සඳහන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා මොරටුව සැපයුම්කරුවකුගෙන් ලබාගත් වෙනස් කිරීම් කිහිපයක් සහිත කඩදාසියක වූ ව්‍යාජ මිල සැඳහුමක් 2013 මාර්තු 12 දින උපකුලපතිවරයා විසින් අනුමත කර තිබුණි. තවද සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මිලට අමතරව සියයට 10 ක ආන්තිකයක්ද ගෙවීම හේතුවෙන් විශ්ව විද්‍යාලයට රු.131,625 ක පාඩුවක් සිදුවී තිබුණි.

### 4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

(අ) 2014 ජූනි 24 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම අනුව, පරිගණක 155 ක් හා යූපී-එස් 06 ක් ප්‍රසම්පාදනය කිරීමේදී දරන ලද රු.4,233,370 ක පාඩුව විශ්ව විද්‍යාලයේ නිලධාරින් 03 දෙනෙකුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද ඉහත පාඩුව 2015 ජූනි 30 දක්වාත් අයකර ගෙන නොතිබුණි. එම කාරණය පිළිබඳ සිදුකරන ලද විනය පරීක්ෂණය සඳහා විමර්ශන නිලධාරියා විසින් කරන ලද නිර්දේශයන් හා ඉදිරිපත් කරන ලද වාර්තාව සඳහා අධ්‍යයනයන් හා සමාලෝචනය කිරීමට සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කිරීමට තීරණය කළ බව මේ සම්බන්ධයෙන් නිසි බලධාරි විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) 2012 ජූනි 23 අත්සන් කරන ලද ගිවිසුම අනුව, විශ්වවිද්‍යාලය, ත්‍රිකුණාමලය පීඨය හා සෞන්දර්ය අධ්‍යයනය සඳහා ස්වාමි විපුලානන්ද ආයතනය (SIVAS) සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා උපදේශක කාර්යයන් 2012 අප්‍රේල් 16 දින සිට මාස 03 ක් ඇතුළත නිම කළ යුතු විය. කෙසේ වුවද එම කාර්යය 2015 ජූනි 30 වන විටත් නිමකර නොතිබුණි.

(ඇ) ශිෂ්‍යත්ව මත විදේශගත වූ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 74 දෙනෙකු ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසුව රාජකාරී සඳහා වාර්තා කර හෝ විශ්ව විද්‍යාලයෙන් ඉවත් වී

නොතිබුණි. කෙසේ වුවද ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් කථිකාචාර්යවරුන් 74 දෙනෙකුගෙන් එකතුව රු.160,937,945 ක මුදලක් අයකර ගැනීමට 2015 ජුනි 30 වන විටත් විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. ගිවිසුම් කඩ කළ 74 දෙනෙකුගෙන් සිද්ධීන් 12 සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හා ලැබිය යුතු මුදල් ඔවුන්ගෙන් අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට භාරදී ඇති බව මේ සම්බන්ධයෙන් නිසි බලධාරි විසින් මා වෙත දන්වා තිබුණි.

(ඈ) ශිෂ්‍යත්ව සඳහා විදේශගත වන කථිකාචාර්යවරුන්ගෙන් නිවාඩු අනුමත කිරීමට පෙර අත්තිකාරම් අයකර ගත යුතුය. කෙසේ වුවද බැඳුම්කර ගිවිසුම් කඩකළ කථිකාචාර්යවරුන් 05 දෙනෙකුගෙන් එකතුව රු.204,551 ක හිඟ අත්තිකාරම් ශේෂයන් අයකර ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍යත්ව සඳහා නිවාඩු ලබාදී තිබුණි.

(ඉ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 72(1) වගන්තිය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21.1.1 වගන්තිය අනුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණියට උසස්වීම් ලැබීම සඳහා කථිකාචාර්ය තනතුරක (පරිවාස) කථිකාචාර්යවරයකු විසින් වර්ෂ 08 ක් ඇතුළත පශ්චාත් උපාධිය සම්පූර්ණ කළ යුතුය. කෙසේ වුවද නිශ්චිත කාල පරිච්ඡේදය තුළ පශ්චාත් උපාධිය සම්පූර්ණ නොකළ කථිකාචාර්යවරුන් 17 දෙනෙකු තාවකාලික කථිකාචාර්යවරුන් ලෙස ඔවුන් ආපසු එම තනතුරු වලට යැවීමෙන් තොරව ජ්‍යෙෂ්ඨ කාථිකාචාර්ය II ශ්‍රේණිය ලෙස උසස්වීම් ලබාදී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ රු.13,399,453 ක් වැය කරමින් විශ්වවිද්‍යාලයේ අමුත්තන්ගේ නිවාසයේ පැරණි ගොඩනැඟිල්ලක් අළුත් වැඩියා කර තිබූ අතර මෙම ගොඩනැඟිල්ලෙන් ඉවත් කරන ලද විදුලි පංකා , විදුලි පහන් , විදුලි උත්පාදන යන්ත්‍ර හා ස්විච්ස් ආදී වටිනා භාණ්ඩ 2012 අගෝස්තු 30 දින විශ්වවිද්‍යාලයේ විදුලි කාර්මිකට භාරදී තිබුණි. කෙසේ වුවද, උප කුලපති නිල නිවසේ පවත්වා ගෙන යන ඉන්වෙන්ට්‍රි ලේඛනයේ මෙම විෂයයන් ඇතුළත් කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(උ) එවකට සිටි උපකුලපතිවරයා 2015 මාර්තු 05 සිට බලපැවැත්වෙන පරිදි විශ්ව විද්‍යාලයෙන් ඉවත්වී තිබුණි. ඔහුගෙන් අයවිය යුතු රු.45,182 ක ණය ශේෂ අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

**4.4 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

විශ්වවිද්‍යාලයේ පීඨ පහක් සඳහා මහාචාර්යවරු ඇතුළත් ප්‍රධාන අධ්‍යයන තනතුරු 23 ක පුරප්පාඩු පැවතුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 64 කින් ජ්‍යෙෂ්ඨ කථිකචාර්ය හා කථිකාචර්ය තනතුරු 41 ක පුරප්පාඩු පැවතුණි. කෙසේ වුවද 2015 ජුනි 30 දක්වාත් මෙම තනතුරු පුරප්පාඩු පිරවීමට විශ්වවිද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

**-------------------------**

" පටක සකස් කිරීම පිළිබඳ උපාංග අටක් " ( eight accessories of the tissue processor) නම් වූ වෛද්‍ය උපකරණය රු.මිලියන 4.5 ක පිරිවැයකට 2012 වර්ෂය තුළ ප්‍රසම්පාදනය කර තිබුණද, පටක සකස් කිරීම් උපකරණයේ ප්‍රධාන කොටස මිලදී ගැනීමට නොහැකිවීම හේතුවෙන් එය මිලදී ගත් දින සිටම සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ නිෂ්කාර්යව පැවතුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 16 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයට ස්ථිර හා පළපුරුදු කාර්ය මණ්ඩලයක් පත් කර නොතිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) හා 4.2.3 වගන්ති ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 3 ක කාල පරිච්ඡේදයක් ඇතුළත සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.4 අයවැය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ණය සහ අත්තිකාරම් අයකර ගැනීම
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය